| 23. | හැවන්දෙනිය ගම්සභා පාරේ පල්ලේවත්තේ සිට උඩහින්නපතන මැදින් එඩවඩහිල් වත්තේ පාරට ... ... | 0 | 15 | 0 ... | 6 |
| 24. | උඩහින්න පහලවෙලට යන ගම්සභා පාර ... | 0 | 40 | 0 ... | 6 |

## ගලක කොට්ඨාශය—අංක 12

### ගම්සභා පාරවල්

| අංකය | පාරේ නම | දිග | | | පළල |
|---|---|---|---|---|---|
| | | හැ. | ද. | අඩි | අඩි |
| 1. | අටබාගේ සැවනේකේ නයාපනේ ප්‍රසිද්ධ පාරේ සිට සපුගහමුල කඩේ ලඟට යන ගම්සභා පාර ... ... | 0 | 28 | 0 ... | 16 |
| 2. | පොල්ගහමුල කඩේ ලඟ සිට අටබාගේ වත්තේ ඇල ලඟට යන ගම්සභා පාර ... | 0 | 6 | 0 ... | 4 |
| 3. | පොල්ගහමුල කඩේ ලඟ සිට ගලක වත්තට යන ගම්සභා පාර ... ... | 0 | 10 | 0 ... | 12 |
| 4. | ගලත විහාරේ ලඟ සිට යටිපියන්ගලට යන ගම්සභා පාර ... ... | 0 | 32 | 0 ... | 6 |
| 5. | පොල්ගහමුල කඩේ ලඟ සිට ගලත පාසල දක්වා යන ගම්සභා පාර ... | 0 | 11 | 0 ... | 6 |
| 6. | යටිපියන්ගල කඩේ ලඟ සිට ගලත දක්වා යන ගම්සභා පාර ... ... | 0 | 10 | 0 ... | 4 |
| 7. | සපුගහමුල සිට පොල්ගහමුල කඩේ ලඟට යන ගම්සභා පාර ... ... | 0 | 30 | 0 ... | 6 |
| 8. | කැකුලන්ද ඉඹුලේ ඇල ලඟ සිට නයාපාන වත්ත දක්වා යන ගම්සභා පාර ... | 0 | 40 | 0 ... | 4 |
| 9. | ගලත වත්තේ සිට මහවිල දක්වා යන ගම්සභා පාර ... ... ... | 0 | 30 | 0 ... | 4 |
| 10. | කැකුලන්ද කෝපි වත්තේ සිට කනපදිවත්තට යන ගම්සභා පාර ... ... | 0 | 30 | 0 ... | 6 |
| 11. | අටබාගේ ප්‍රසිද්ධ පාරේ සිට සැන්කුවායර් වත්ත මැදින් නුවරඑළි ප්‍රසිද්ධ පාරට යන ගම්සභා පාර ... ... | 0 | 26 | 0 ... | 4 |
| 12. | යටිපියන්ගල සිට ඕර් වෙල් වත්ත මැදින් දේවිම පාලමට යන ගම්සභා පාර ... | 0 | 70 | 0 ... | 12 |
| 13. | කැකුලන්ද නයාපාන ගම්සභා පාර බොගහ ලඟ සිට පන්සල නයාපාන කොලනිය හරහා නයාපානවත්තේ කරත්ත පාරට යන ගම් සභා පාර ... ... | 0 | 10 | 0 ... | 6 |

## මාවතුර කොට්ඨාශය අංක 13

### ගම්සභා පාරවල්

| අංකය | පාරේ නම | දිග හැ. | දිග දා. | දිග අඩි | පළල අඩි |
|---|---|---|---|---|---|
| 1. | ගඩහදෙහිඇලේ සිට වැලිපොල කුඹුර දක්වා | 0 | 11 | 0 | 4 |
| 2. | කනපදිවත්තේ 3 වෙනි ලැයිම ලඟ සිට ස්ටෝරුව දක්වා ... ... | 0 | 24 | 0 | 6 |
| 3. | මාවතුර කරත්ත පාරේ සිට නයාපාන ස්ටෝරුව දක්වා ... ... | 0 | 28 | 0 | 4 |
| 4. | මාවතුර කරත්ත පාරේ සිට කලුගල්හින්න දක්වා ... ... | 0 | 23 | 0 | 16 |
| 5. | කලුගල්හින්න පාසල ලඟ සිට මහවිලවත්ත දක්වා ... ... | 0 | 32 | 0 | 16 |
| 6. | මාවතුර කහත්ත පාරේ සිට පිටලියද්ද හරහා කනපදිවත්තේ නො. 13 ලයිම ලඟට ... | 0 | 15 | 0 | 4 |
| 7. | මාවතුර පිලිවෙල ගම හරහා ඔරුතොටමුල්ල ගම්සභා පාරට ... ... | 1 | 46 | 0 | 16 |
| 8. | මාවතුර ටවුමේ සිට සුදුඅඹෙකොටුව මැදින් යන ගම්සභා පාර ... ... | 0 | 10 | 0 | 4 |
| 9. | උඩගම්මැද්ද සිට කිතුල්හේන නයාපාන ගම් සභා පාර ... ... | 1 | 2 | 0 | 4 |
| 10. | පිලිවෙල ගම මහවිලවත්ත ප්‍රසිද්ධ පාර දක්වා | 0 | 15 | 0 | 4 |
| 11. | ගල්ලන්දේ මඩවත්තේ සිට ප්‍රසිද්ධ පාර දක්වා | 0 | 15 | 0 | 4 |
| 12. | උඩගම්මැද්දේ සිට කිතුල්හේනේ සුසාන භූමියට යන ගම්සභා පාර ... | 0 | 12 | 0 | 4 |

10–703—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## ගම්සභා ආඥාපනත

### 17 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

1961 අංක 60 දරන පනතින් සංශෝධිත ගම්සභා ආඥාපනතේ (257 වැනි අධිකාරය) 17 (5) දරණ වගන්තියෙන් මා කෙරෙහි පැවරී ඇති බලයේ ප්‍රකාර, දකුණු කොටස (ඉහළ) පළාත් පාලන සහකාර කොමසාරිස්, කෝ'ලිත වල්ගමගේ වන මා විසින් ගාලු දිස්ත්‍රික්කයේ පොද්දිවල-නියාගම ගම්සභාවට සභාපති වරයකු තෝරා පත්කර ගැනීම සඳහා රැස්වීමක් 1965 ඔක්තෝබර් මස 25 වැනි දින උදේ 10 ට මත්තක පිහිටි පොද්දිවල-නියාගම ගම්සභා කාර්යාලයේදී මෙයින් කැඳවා සිටිනු ලැබේ.

කෝ'ලිත වල්ගමගේ,
පළාත් පාලන සහකාර කොමසාරිස්,
(දකුණු කොටස ඉහළ).

1965 ඔක්තෝබර් මස 13 වැනි දින,
ගාල්ලේ පළාත් පාලන කාර්යාලයේදීය.

10–729—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

# තනතුරු—ඇබෑර්තු

## ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි IV වැනි කොටසෙහි පළ කෙරෙන පළාත් පාලන සේවා තනතුරුවලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

1. **දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශෙෂ ජීවන දීමනාව යන මේ දීමනා, ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයකින් සඳහන් කොට නැති අවස්ථාවන්හිදී ආණ්ඩුවේ ප්‍රමාණයන් හා කොන්දේසි අනුව ගෙවනු ලැබේ.

2. **සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී, පළාත් පාලන සේවා ආඥාපනතේ (264 වැනි අධිකාරය) විධිවිධාන, ඒ පිළිබඳ සංශෝධන හා ඒ යටතේ සම්පාදිත රෙගුලාසිවලටත්, කොමිෂන් සභාව විසින් කලින් කලට නියම කරනු ලබන අතිකූත් සේවා කොන්දේසිවලටත් යටත් වෙයි.

3. **සේවයට බාර ගැනීම පිළිබඳ කොන්දේසි.**—1952 අගෝස්තු මස 3 වැනි දිනය හා 10,432 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසෙහි පළ කරනලද උපලේඛනයෙහි සඳහන් තනතුරුද කලින් කල ඒ උපලේඛනයට එකතු කරන අනිත් තනතුරුද ස්ත්‍රීන් නොවන පළාත් පාලන සේවා සාමාජිකයන් විසින් උසුලන ලබද්දී, 1952 පළාත් පාලන සේවා විශ්‍රාම වැටුප් ක්‍රම රෙගුලාසි යටතේ, විශ්‍රාම වැටුප් සහිත තනතුරු වන්නේ ය.

(අ) ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරීන් ආණ්ඩුවේ විශ්‍රාම වැටුප් ව්‍යවස්ථාවල 21 වැනි වගන්තිය යටතේ සේවයෙන් මුදා හරිනු ලැබ පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට මාරු කර හරිනු ලැබුව හොත් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් අයිති වාසිකම් ආරක්ෂා වේ.

(ආ) ප්‍රාදේශික බල මණ්ඩලවල විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හෝ නියෝග හෝ යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරණ සේවකයන් සම්බන්ධයෙන් වූ විට, ඔවුන් අවසානයේදී සේවයෙන් විශ්‍රාම ගැනීමේදී ඔවුන්ට විශ්‍රාම වැටුප් ගෙවීම තීරණය කරනු ලබන්නේ 1948 අංක 8 දරණ පළාත් පාලන සේවා (සංශෝධන) පනතින් සංශෝධිත වූ 1954 අංක 43 දරණ පළාත් පාලන සේවා ආඥාපනතේ 48 වැනි වගන්තියේ ප්‍රකාර පළාත් පාලන සේවයට මාරුකරනු ලැබූ දිනයට ඉස්සරින්දා ඔවුන් සේවයේ යෙදී සිටි ප්‍රාදේශීය බල මණ්ඩලයෙහි විශ්‍රාම වැටුප් අතුරු ව්‍යවස්ථා හා නියෝග අනුව ය.

(ඇ) ස්ත්‍රීන්ද, වයස 55ට වැඩි නිලධාරීන් ද පළාත් පාලන සේවයට පත් කරන ලද දිනයට ඉස්සරින්දා ආණ්ඩුව යටතේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු දරූ නිලධාරීන් ද හැර විශ්‍රාම වැටුප් සහිත තනතුරු වලට පත් කෙරෙන සියලු දෙනාට ම, 1952 ජූනි 30 වැනි දිනය හා අංක 10,429 වැනි අංකය දරණ ලංකාණ්ඩුවේ අති විශේෂ ගැසට් පත්‍රයෙහි පළ කරන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදල් රෙගුලාසි යටතේ පිහිටුවන ලද පළාත් පාලන සේවා වැන්දඹු හා අනාත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට ස්වකීය වැටුපෙන් සියයට 4 ක දායක මුදලක් ගෙවීමට නියම කරනු ලැබේ. ප්‍රාදේශික බල මණ්ඩලය විසින් ඒ ඒ නිලධාරියාගේ වැටුපෙන් සියයට 3ක දායක මුදලක් ගෙවනු ලැබේ.

(ඈ) ප්‍රාදේශික බල මණ්ඩලය විසින් නියම කරනු ලබන මුදලක් මුදලින්ම හෝ පළාත් පාලන සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද ඇපකාර සමාගමක් මගින් ඉදිරිපත් කරන විශ්වාස සහතික ඇප ඔප්පුවක් මගින් හෝ ඇප තබන ලෙස මේ තනතුරු වලට පත් වන්නන්ට නියම කළ හැකිය.

(ඉ) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම පළාත් පාලන සේවයට අයත් උපලේඛනගත තනතුරු නොදරන්නන්ට දිවයිනේ කවර පෙදෙසක වුව ද සේවය කිරීම සඳහා ශාරීරික වශයෙන් ඔවුන් සුදුසු ද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස සුදුසුකම්ලත් වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

(ඊ) අන්‍යාකාරයකින් නියම කොට නැති කල්හි සාමාන්‍යයෙන් පත්වීම අවුරුදු තුනක ආධුනික කාලයකට හෝ අවුරුදු තුනකින් පසු ස්ථිර කරනු ලැබීමට හෝ යටත් වෙයි.

(උ) අයදුම්කරුවන් නියම කරනු ලැබූ අවස්ථාවක ඔවුන්ගේ උප්පැන්න සහතික හෝ අනුමාන වයස පිළිබඳ සහතික ඉදිරිපත් කිරීමට සූදානම් වී සිටිය යුතුයි.

4. **නව ප්‍රවේශක නිලධාරීහු.**—(i) අදාළ පරිදි විශ්‍රාම වැටුප් සහිත/ විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත්කරනු ලැබූ නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය යම්කිසි තනතුරු වෙනුවෙන් වඩා දීර්ඝ කාලයක් නියම කොට නැත්නම් අවුරුදු 3ක් වන්නේ ය.

(ii) ආණ්ඩුවේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහාත් විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ සම්පාදිත නියෝග හෝ මින් මතු සම්පාදනය කළ හැකි නියෝග වලටත් අනුකූලව ක්‍රියා කරන ලෙස "නව ප්‍රවේශක නිලධාරීන්ටත්" නියම කරනු ලැබෙයි.

(iii) (අ) ස්වකීය ආධුනික සේවා කාලය/වැඩ පරීක්ෂා කාලය ඇතුළත දී සිංහල භාෂාව විෂයයෙහි ප්‍රවීණතාවක් ලබාගන්නා ලෙස මේ නිලධාරීන්ට නියම කරනු ලැබෙයි.

(ආ) උපන් දිනය :————.

| අවුරුද්ද | මාසය | දිනය |
| --- | --- | --- |
| | | |

5. උපන් ස්ථානය :—

(අ) අයදුම්කරු :————.

(ආ) අයදුම්කරුගේ පියා :————.

(ඇ) අයදුම්කරුගේ පියාගේ පියා :————.

(ඈ) අයදුම්කරුගේ පිය පස මුත්තා :————.
(අයදුම්කරු ලංකාවේ උපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) හෝ (ඇ) (ඈ) යන දෙකම හෝ පිරවිය යුතුයි. ඔහු ලංකාවේ නූපන් කෙනෙක් නම් (අ) පමණක් නොව (ආ) සහ (ඇ) හෝ (ඈ) සහ (ඉ) හෝ පිරවිය යුතුයි.)

6. විවාහකද ? අවිවාහකද ? වැන්දඹුද ? :————.

7. වයස අවුරුදු 12 සිට ඉගෙන ගත් පාඨශාලා, විද්‍යාල සහ අනිකුත් ආයතන :—

**සාමාන්‍ය අධ්‍යාපනය**

| පාඨශාලාව හෝ විද්‍යාලය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

**වෘත්තීය/ශිල්පීය අධ්‍යාපනය**

| විද්‍යායතනය | සිට | දක්වා |
| --- | --- | --- |
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |
| 5. | | |

8. අධ්‍යාපන සුදුසුකම් හා අන්තිමට සමත් වූ විභාගය දිනයත් සමග :—

(අ) සිංහල :————.

(ආ) ඉංග්‍රීසි :————.

(ඇ) දෙමළ :————.

9. ලබාගෙන ඇති වෘත්තීය සහ හෝ ශිල්පීය සුදුසුකම්, ලැබූ දින හා ආයතනවල නම් :————.

10. ඉගෙනගත් පාඨශාලාව හා එයින් අස්වූ දිනය :————.

11. (අ) පාඨශාලාවෙන් අස්වූ දින සිට කළ රක්‍ෂා (පත් වූ දිනයත් හා අස්වූ දිනයත් දක්වමින් දරූ තනතුරු සඳහන් කරන්න) :————.

(ආ) මීට පළමු ආණ්ඩුව යටතේ හෝ පළාත් පාලනායතනයක් යටතේ ස්ථිර වශයෙන් හෝ තාවකාලික වශයෙන් රක්‍ෂා වෙහි යෙදී සිටියේ නම් සහ ඒ සේවය යම් කලක නතර කරන ලද්දේ නම් එසේ සේවය නතර කිරීමට ඇති හේතු හා එසේ කළ දින පැහැදිලි වශයෙන් දක්වන්න :————.

(ඇ) පළාත් පාලන ආයතනවල සේවා කාලය පිළිබඳ සටහන් (තනතුරු), පළාත් පාලනායතන හා කාලසීමාවන් : ————.

(ඈ) දැනට කරන රක්‍ෂාව—පහත සඳහන් විස්තර දෙන්න :—

(i) තනතුරේ පදවි නාමය, ශ්‍රේණිය හා ඊට පත් වූ දිනය :————.

(ii) දීමනා හැර දැනට ලබන වැටුප් හා වැටුප් ක්‍රමය : ————.

(iii) විශ්‍රාම වැටුප් සහිතද :————.

(ඉ) සේවා මුක්ත භටයෙක් නම් :—
සේනාංකය, තරාතිරම, සේවයට බැඳුන දින හා නිදහස් කරන ලද දින පිළිබඳ විස්තර :————.

12. කියවීම, ලිවීම, කතා කිරීම, භාෂණ පරිවර්තනය පිළිබඳව ප්‍රවීණතාවක් ඇද්ද :————.

(අ) සිංහල :————.

(ආ) දෙමළ :————.

13. විශේෂ සුදුසුකම්—ගැසට් නිවේදනයෙහි සඳහන් කොට ඇති විශේෂ සුදුසුකම් සහ/හෝ පළපුරුද්ද ඔබට තිබේද ? එසේ නම්, ඒ පිළිබඳ සම්පූර්ණ විස්තර, දින වකවානු සහිතව සඳහන් කරන්න :————.

14. කිසියම් අපරාධ වරදක් සඳහා අධිකරණය මගින් වරදකරු කරනු ලැබුවේ ද ? එසේ නම් දිනය, නඩු නොම්මරය හා වරදෙහි ස්වභාවය සඳහන් කරන්න :————.

15. මුදල් කරදරවලින් නිදහස් ද ? එසේ නැත්නම් ඔබේ ණය බැඳීම්වල ප්‍රමාණය කෙතෙක් ද ? :————.

16. වෙනත් විස්තර (විශේෂ හිමිකම් ආදිය) :————.

17. චරිත සහතික ලබාගත් අයගේ නම් සහ පදවි නාම :————.
(ඉදිරිපත් කළ යුත්තේ ඒ සහතිකවල මුල් ලිපි නොව පිටපත් පමණි. පළාත් පාලන සේවයේ උපලේඛනගත තනතුරු දරණ සාමාජිකයින් විසින් මේ නියමයේ ප්‍රකාර ක්‍රියා කළ යුතු නොවේ.)

මේ අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් කිසියම් කරුණක් අසත්‍ය හෝ වැරදි බැව් තෝරා ගනු ලැබීමට පළමු සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සෙකු බවට පත් වන බවත්, පත් කිරීමෙන් පසු වරද අනාවරණය වුවහොත් වන්දියක් නොමැතිව මා සේවයෙන් පහ කළ හැකි බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
පළාත් පාලන සේවා කොමිෂන් සභාව,
තැ. පෙ. 530,
කොළඹ 1.

## පළාත් පාලන සේවය—නාගරික රස පරීක්‍ෂක තනතුර

ඉහත සඳහන් තනතුර සඳහා පළාත් පාලන සේවා කොමිෂන් සභාව අයදුම් පත්‍ර කැඳවයි. තෝරාගනු ලබන අයදුම්කරු පළමුකොටම කොළඹ නාගරික සභාවේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට පත්කරනු ලබන අතර කොළඹ නාගරික සභා සීමාව තුළ වාසය කිරීමට නියම කරනු ලැබේ.

2. වැටුප.—තනතුරට නියමිත වැටුප් ක්‍රමය—රු. 8,400—10×480—2×600 රු. 14,400 වර්‍ෂයකට. වර්‍ෂයකට රු. 11,280 ට පෙර ඇවුරුදු නැවැත්මක් සහ වර්‍ෂයකට රු. 11,760 ට පෙර කාර්යක්‍ෂමතා කඩ ඉමක් ඇත. තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන අයදුම්කරු ස්වකීය සුදුසුකම් හා පළපුරුද්දට අනුව වැටුප් ක්‍රමයේ සුදුසු වැටුප් පෙත්තක් මතට පමුණුවනු ලැබෙයි.

3. අවශ්‍ය සුදුසුකම්.—අයදුම්කරුවෝ ආහාර, ඖෂධ හා ජලය විශ්ලේෂණය පිළිබඳ යටත් පිරිසෙයින් අවුරුද්දක පළපුරුද්දක් සහිත මහා බ්‍රිතාන්‍යයේ සහ අයර්ලන්තයේ රසායන විද්‍යාව පිළිබඳ රාජකීය ආයතනයේ සංගමිකයන් (ඊ අංශය—ආහාර සහ ඖෂධ) විය යුත්තාහ. ගෑස් වායු විශ්ලේෂණය පිළිබඳ පළපුරුද්ද අතිරේක සුදුසුකමක් වනු ඇත.

4. තෝරාගනු ලබන අයදුම්කරුට පෞද්ගලික වෘත්තියෙහි යෙදීමට අවසර නැති අතර, අවශ්‍යවෙයි නම් සහ අවශ්‍යවූ විටෙක ඉරිදා දින යන්හි සහ රජයේ නිවාඩු දිනයන්හි රාජකාරි කළයුතු වෙයි.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයෙහි පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධ යෙන් අදාළවන සාමාන්‍ය කොන්දේසි බලන්න.

6. ඉල්ලුම් පත්‍ර, පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව පිළියෙල කොට, මා වෙත පහත සඳහන් දින හෝ ඊට පෙර ලැබෙන ලෙස එවිය යුතුය :—

1965.12.21 සඳහන් කරන ලද ආකෘති පත්‍රයේ 13 වෙනි ඡේදය වෙනුවට පහත සඳහන් කරුණු යොදාගත යුතුය :—

"13(අ) ආහාර, ඖෂධ හා ජලය විශ්ලේෂණය පිළිබඳ පළපුරුද්ද (සම්පූර්ණ විස්තර සඳහන් කරන්න දින සහිතව) :————.

(ආ) වායු විශ්ලේෂණය පිළිබඳ පළපුරුද්ද ඇත්නම් ඒ ගැන විස්තර සඳහන් කරන්න :————.

7. අයදුම් පත්‍ර හෝ ඊට අදාල අනිකුත් ලියුම් කියුම් එවිය යුත්තේ පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති වෙත මිස, මේ දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියෙකුගේ **පෞද්ගලික** නමට **නොවේ.**

8. නියමිත දිනට පසුව මේ කාර්යාලයට ලැබෙන ආණ්ඩුවේ හෝ පළාත් පාලනායතනවල සේවයේ යෙදී සිටින නිලධාරීන්ගේ අයදුම් පත්‍ර භාරගනු ලබන්නේ, ඒවා සවකීය දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ පළාත් පාලනායතනයෙක නාගරික කොමසාරිස්වරයා හෝ සභාපතිවරයා වෙත නියමිත දින හෝ ඊට ප්‍රථම භාරදී තිබී, ප්‍රමාදයට හේතුවූ පිළිගත හැකි කරුණු දක්වමින්, ඔවුන් විසින් ඒවා පිළිගන්නා ලෙස නිර්දේශ කළහොත් පමණි.

9. සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත් පමණක් ලැබුණු බව දන්වනු ලැබේ.

පළාත් පාලන සේවා කොමිෂන් සභාවේ සභාපති.

1965 ඔක්තෝබර මස 1 දින,
තැ. පෙ., 530, කොළඹ.

10–482—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## පළාත් පාලන සේවය

### මුරකරු තනතුර—පුත්තලම් පත්තු ගම්සභාව

ඉහත සඳහන් තනතුර සඳහා අයදුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් ක්‍රමය :** වර්ෂයකට රුපියල් 540—30×8—24×1—රු. 804. රු. 636 සහ රු. 732 වාර්ෂික වැටුප්වලට පළමු කාර්යක්ෂමතා කඩයිම් ඇත.

3. **අවශ්‍ය සුදුසුකම් :—**

(අ) **වයස :** 1965.11.2 වැනි දිනට වයස අවුරුදු 25 ට නොඅඩු, 40 ට නොවැඩි විය යුතුයි.

(ආ) අපේක්ෂකයෝ සිංහල/දෙමල 5 වැනි ප්‍රමාණයෙන් සමත්වී සිටිය යුත්තාහ. දෙවැනි භාෂාව පිළිබඳ ක්‍රියාත්මක දැනීමක් අතිරේක සුදුසුකමක් වනු ඇත. හොඳ ශාරීරික පෙනුමකින් යුක්ත විය යුත්තාහ.

4. පළාත් පාලන සේවා සාමාජිකයන්ගේ හා ප්‍රාදේශීය බලමණ්ඩලවල ස්ථිර සේවයේ සිටින සේවකයන්ගේ අයදුම් පත්‍ර ඔවුන් අනික් සුදුසුකම් ලබා ඇත්නම්, වයස පිළිබඳ නියමය නොතකා සලකා බලනු ලැබේ.

5. මේ ගැසට් පත්‍රයේ IV වැනි කොටසේ ආරම්භයේ පළකර තිබෙන පළාත් පාලන සේවයේ තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන සාමාන්‍ය කොන්දේසි බලනු මැනවි.

6. ඉල්ලුම් පත්‍ර පත්කිරීම් සම්බන්ධයෙන් යෙදෙන පොදු කොන්දේසි යටතේ ඇති ආදර්ශ ආකෘති පත්‍රයට අනුව සාරානුකූලව පිළියෙල කොට 1965.11.2 වැනි දිනට හෝ ඊට පළමු පුත්තලම් පත්තු ගම්සභාවේ සභාපති වෙත ලැබෙන්නට එවිය යුතුයි.

ඩබ්ලිව්. පී. කැණිසියස් පීරිස්,
පුත්තලම් පත්තු ගම්සභාවේ සභාපති.

1965 ඔක්තෝබර් මස 2 වැනි දින,
පුත්තලම් පත්තු ගම්සභා කාර්යාලයේ දී ය.

10–488—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

# පළාත් පාලන සහා ඡන්ද ආඥපනත යටතේ දැන්වීම්

## ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනත (262 වැනි අධිකාරය)

### මහනුවර දිස්ත්‍රික්කය—උඩපළාත කඳුකර ඉහල ගම්සභාව

ප්‍රාදේශීය බලමණ්ඩල ඡන්ද විමසීම් ආඥාපනතේ (262 වැනි අධිකාරය) 66 (2) වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙනු ලබන්නේ උඩපළාත කඳුකර ඉහල ගම් සභාවේ අංක 2 දරණ කොට්ඨාශය වෙනුවෙන් පෙනී සිටීම සඳහා, වාසල්තිලකගේ සිරිසේන රාජපක්ෂ මහතා ඡන්දයෙන් තෝරා පත් කර ගන්නට යෙදුන බවය.

ඊ. ඇෆ්. ඩයස් අබේසිංහ,
මැතිවරණ කොමසාරිස් (ප්‍රාදේශීය බලමණ්ඩල).

1965 ඔක්තෝබර් 4 වැනි දින,
කොළඹ දීය.

10–714—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

# අය-වැය ලේඛන

## වත්තල-මාබෝලේ පළාත් ආණ්ඩු සභාව

### අය-වැය ලේඛනය

### 1965 වර්ෂයේ 2 වන අතිරේක වැය ශීර්ෂය

| වියදම් ශීර්ෂය | මුදල | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඊ.—සනීපාරක්ෂාව :— | රු. ශත | |
| 2. කසල ශෝධනය— | | |
| (බී) කරත්ත, ගොනුන් සහ ලොරි ... | 500 0... | යෝජනා අංක 1 සහ 65.9.6 |
| 3. වැසිකිළි පවිත්‍ර කිරීම— | රු. ශ, | |
| (බී) කරත්ත, ගොනුන් සහ ලොරි ... | 500 0... | යෝජනා අංක 1 සහ 65.9.6 |
| එකතුව ... | 1,000 0 | |

පී. ආර්. පර්සි ඩයස්,
සභාපති,
වත්තල-මාබෝලේ පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කාර්යාලය,
වත්තල,
1965 ඔක්තෝබර් මස 4 වැනි දින.

10–696—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## මොරටු නගර සභාව

### අතිරේක අයවැය ලේඛනය අංක 2—1965

| වැය ශීර්ෂය | මුදල රු. ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 1. නිලධාරීන්ගේ වැටුප්— | | |
| (ඊ) විශ්‍රාම වැටුප් ... ... ... | 581 87 ... | 1965.8.11 දින අංක 21 |
| | 3,791 0 ... | 1965.8.21 දින අංක 50 |
| 2. කාර්‍යමණ්ඩලීය වියදම්— | | |
| (ඇල්) ජීවනාධාර ... ... ... ... | 2,359 0 ... | එම |
| (ඇම්) විශේෂ ජීවනාධාර ... ... ... ... | 720 0 ... | එම |
| 4. දීමනා සහ ආධාර— | | |
| (ඩී) හදිසි අනතුරු සහනාධාර ... ... ... | 500 0 ... | 1965.9.18 දින අංක 57 |

| වැය ශීර්ෂය | මුදල රු. | ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|---|
| බී.—මහා මාර්ග :— | | | |
| 4. ආලෝක කිරීම— | | | |
| (බී) විදුලි බුබුළු මිලයට ගැනීම ... ... ... | 3,000 | 0 | ... 1965.9.18 දින අංක 56 |
| (සී) පහන් සවිකරණ උපකරණ මිළයට ගැනීම ... ... | 3,000 | 0 | ... එම |
| සී.—තානායම් සහ අම්බලම් :— | | | |
| (2) නඩත්තුකිරීම ... ... ... ... | 2,000 | 0 | ... 1965.8.21 දින අංක 48 |
| ඩී.—නගර සභා ඉඩම් හා ගොඩනැගිලි :— | | | |
| (4) නඩත්තුකිරීම ... ... ... ... | 1,600 | 0 | ... 1965.7.10 දින අංක 21 |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව :— | | | |
| 4. පාලන හා සාමාන්‍ය වියදම්— | | | |
| (සී) මුද්‍රණ වැඩ හා ලිපි ද්‍රව්‍ය ... ... ... | 1,000 | 0 | ... 1965.8.21 දින අංක 48 |
| 8. ආපසු ගෙවීම් ... ... ... ... | 250 | 0 | ... 1965.9.18 දින අංක 47 (II) |
| | 18,801 | 87 | |

එච්. ඩබ්ලිව්. ස්ටැන්ලි ප්‍රනාන්දු,
මොරටු නගර සභාපති.

1965.10.7 දින,
මොරටු නගර සභා කාර්යාලයේදී ය.

---

## මොරටු නගර සභාව

**මුදල් නීති රෙගුලාසියේ අංක 12 (ii) යටතේ කරන ඉල්ලීමයි.**

### අය—වැය ලේඛනය—1965

පහත දැක්වෙන ඉතිරි මුදල් යටතේ සඳහන් ශීර්ෂවල මුදල් ඒ හා සමග දැක්වෙන වැඩිපුර වියදම් යටතේ ශීර්ෂවලට මාරුකර ඉන් වැය කිරීම සඳහා 1965.8.21 දින පැවැති මොරටු නගර සභා අංක 21 සහ 1965.9.18 දින පැවැති මොරටු නගර සභා අංක 56 දරන යෝජනාවලින් නගර සභා අනුමැතිය ලබාගන්නා ලදී.

| ඉතිරි මුදල් | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 1. නිලධාරීන්ගේ වැටුප්— | | |
| (බී) ලිපිකරුවන් සහ ආදායම් පරීක්ෂකයින් ... | 4,000 | 0 |
| 2. කාර්‍යමණ්ඩලීය වියදම්— | | |
| (ඒ) දීමනා ... ... ... | 500 | 0 |
| (සී) බදු අයකරන්නන්ට කොමිස් ... ... | 1,000 | 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (13) ජීවනාධාර ... ... ... | 260 | 0 |
| ඊ.—මහජන සනීපාරක්ෂාව :— | | |
| 1. සාමාන්‍ය— | | |
| (බී) දීමනා ... ... ... | 1,675 | 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (8) සංවර්ධන කටයුතු ... ... ... | 2,500 | 0 |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව :— | | |
| 6. දීර්ඝ කිරීම හා සංවර්ධන වැඩ— | | |
| (ඒ) උපකරණ ... ... ... | 4,000 | 0 |
| 4. පාලන හා සාමාන්‍ය වියදම්— | | |
| (ඒ) වේතන ආදිය ... ... ... | 1,000 | 0 |
| 6. දීර්ඝකිරීම් හා සංවර්ධන වැඩ— | | |
| (බී) කම්කරු වැඩ ... ... ... | 1,500 | 0 |
| ඇම්.—කියවීම්ශාලා සහ පුස්තකාල :— | | |
| (2) පොත්, සඟරා ආදිය ... ... | 600 | 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (3) යන්ත්‍ර හා ආයුධ ... ... ... | 10,500 | 0 |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව :— | | |
| 6. දීර්ඝකිරීම් හා සංවර්ධන වැඩ— | | |
| (ඒ) උපකරණ ... ... ... | 2,798 | 0 |
| | 30,333 | 0 |

| වැඩිපුර වියදම් | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 1. නිලධාරීන්ගේ වැටුප්— | | |
| (ඒ) ලේකම් ... ... ... | 260 | 0 |
| (ඊ) විශ්‍රාම වැටුප් ... ... ... | 4,100 | 0 |
| 2. කාර්‍යමණ්ඩලීය වියදම්— | | |
| (එල්) ජීවනාධාර ... ... ... | 2,000 | 0 |
| (එම්) වි. ජීවනාධාර ... ... ... | 1,000 | 0 |
| ඊ.—මහජන සනීපාරක්ෂාව :— | | |
| 7. වෙළඳ පොළවල් හා ගාල්— | | |
| (ඒ) වේතන ... ... ... | 75 | 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (2) නඩත්තු කිරීම ... ... ... | 2,500 | 0 |
| ජේ.—විදුලි දෙපාර්තමේන්තුව :— | | |
| 3. සේවා සහ නිවාසවලට කම්බි ඇදීම— | | |
| (ඒ) උපකරණ ... ... ... | 4,000 | 0 |
| (ඊ) මීටර මිළයට ගැනීම ... ... | 2,500 | 0 |
| ඇම්.—කියවීම්ශාලා සහ පුස්තකාල :— | | |
| (3) ලිබඩු ... ... ... | 600 | 0 |
| බී.—මහා මාර්ග :— | | |
| (2) නඩත්තු කිරීම ... ... ... | 4,000 | 0 |
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 2. කාර්‍යමණ්ඩලීය වියදම්— | | |
| (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ වැඩ හා දැන්වීම් පළ කිරීම හා කාර්‍යාලීය වියදම් ... ... | 3,000 | 0 |
| ඊ.—මහජන සනීපාරක්ෂාව :— | | |
| 5. ජල සම්පාදනය— | | |
| (සී) නඩත්තුකිරීම ... ... | 1,000 | 0 |
| අයි.—කිරුම් හා මිණුම් :— | | |
| (2) උපකරණ ... ... ... | 2,500 | 0 |
| බී.—මහා මාර්ග :— | | |
| 4. ආලෝකකිරීම— | | |
| (සී) පහන් සවිකරණ උපකරණ මිළයට ගැනීම ... | 2,798 | 0 |
| | 30,333 | 0 |

එච්. ඩබ්ලිව්. ස්ටැන්ලි ප්‍රනාන්දු,
මොරටු නගර සභාපති.

1965.10.7 දින,
මොරටු නගර සභා කාර්යාලය.

10–698—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

## කළුතර නගර සභාව

**1965 වර්ෂයේ දෙවැනි අතිරේක වැය ලේඛනය**

| වැය ශීර්ෂය | මුදල් රු. | ශ. | යෝජනා අංකය හා දිනය |
|---|---|---|---|
| ඊ. 7(ඩී) ... | ... 2,000 | 0 | ... අංක 24 සහ 22.5.65 |
| අයි. 1 ... | ... 200 | 0 | ... අංක 15 සහ 22.5.65 |
| අයි. 2 ... | ... 50 | 0 | ... අංක 15 සහ 22.5.65 |
| ඩී. 4 ... | ... 4,000 | 0 | ... අංක 18 සහ 19.6.65 |
| ජේ. 3(ඒ) ... | ... 1,500 | 0 | ... අංක 18 සහ 19.6.65 |
| ඒ. 1(ට්) ... | ... 3,000 | 0 | ... අංක 22 සහ 21.8.65 |
| ඒ. 2(සී) ... | ... 3,500 | 0 | ... අංක 22 සහ 21.8.65 |
| ඒ. 2(එෆ්) ... | ... 3,000 | 0 | ... අංක 22 සහ 21.8.65 |
| ඊ. 1(ජී) ... | ... 6,000 | 0 | ... අංක 22 සහ 21.8.65 |
| ඊ.5 (සී) ... | ... 750 | 0 | ... අංක 22 සහ 21.8.65 |
| ඊ. 6(බී) ... | ... 6,000 | 0 | ... අංක 22 සහ 21.8.65 |
| ඊ. 7(බී) ... | ... 1,500 | 0 | ... අංක 22 සහ 21.8.65 |
| අයි. 2 ... | ... 150 | 0 | ... අංක 22 සහ 21.8.65 |
| ජේ. 3(ඒ) ... | ... 5,000 | 0 | ... අංක 22 සහ 21.8.65 |
| ඒ. 2(එෆ්) ... | ... 2,000 | 0 | ... අංක 13 සහ 18.9.65 |
| ඩී. 4 ... | ... 6,000 | 0 | ... අංක 13 සහ 18.9.65 |
| ඊ.1(එච්) ... | ... 1,000 | 0 | ... අංක 13 සහ 18.9.65 |
| ඊ.2 (බී) ... | ... 2,400 | 0 | ... අංක 17 සහ 18.9.65 |
| ඊ. 6(බී) ... | ... 3,000 | 0 | ... අංක 13 සහ 18.9.65 |
| එෆ්. 2 ... | ... 1,500 | 0 | ... අංක 13 සහ 18.9.65 |

කේ. ඇම්. වික්‍රමසිංහ,
කළුතර නගර සභාපති.

1965 ඔක්තෝබර් 5 දින,
නගර සභා කාර්යාලය,
කළුතර.

10–711—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව

**මුදල් රෙගුලාසි අංක 12 (ii) යටතේ කෙරෙන අයදුම් පතයි**

1965 අය–වැය ලේඛනය

1965 අය-වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂයන් යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරි වේයයි ගණන් බලන ලද පහත දක්වෙන වැය ශීර්ෂ යටතේ සඳහන් මුදල්, ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂවලට මාරුකර, අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1965 ක්වූ සැප්තැම්බර් මස 29 වෙනි දින පවත්වන ලද මාසික රැස්වීමේ අංක 11 (12) දරණ සභා තීරණයෙන් සම්මත වී තිබේ.

**1965 අය-වැය ලේඛනයේ වෙන්කර තිබෙන මුදල් වලින් ඉතිරිවේයයි ගණන් බලන ලද ශීර්ෂයන් හා මුදල්**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 2. කායඃමණ්ඩලීය වියදම් :— | | |
| (සී) අයබදු අය කරන්නන්ට කොමිස් ... ... | 200 | 0 |
| ඩී.—නගර සභා ඉඩම් සහ ගොඩනැගිලි :— | | |
| 7. අළුත් වැඩ ... ... ... | 5,250 | 0 |
| එකතුව ... | 5,450 | 0 |

**අතිරේක වැය අවශ්‍ය වී තිබෙන ශීර්ෂයන් හා මුදල්**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | | |
| 2. කායඃ මණ්ඩලීය වියදම් :— | | |
| (බී) ගමන් ගාස්තු ... ... ... | 200 | 0 |
| බී.—මංමාවත් :— | | |
| 2. නඩත්තුව ... ... ... | 2,000 | 0 |
| 12. අළුත් වැඩ ... ... ... | 500 | 0 |
| සී.—තානායම් :— | | |
| 4. සංවර්ධනය ... ... ... | 2,750 | 0 |
| එකතුව ... | 5,450 | 0 |

ලීලාරත්න විජේසිංහ,
සභාපති,
අවිස්සාවේල්ල පළාත් ආණ්ඩු සභාව.

පළාත් ආණ්ඩු සභා කායඃාලය,
අවිස්සාවේල්ල, 1965.9.29.

10–715—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## මුල්ලේරියාව සුළු නගර සභාව

**1965 වර්ෂයේ 1 වැනි අතිරේක අය-වැය ලේඛනය**

I වැනි කොටස—සාමාන්‍ය

| වැය ශීර්ෂය | මුදල රු. ශ. |
|---|---|
| ඒ.—සාමාන්‍ය වියදම් :— | |
| 2. සංස්ථා වියදම්— | |
| (සී) අයකැමි ගාස්තු (අත් අත්දමකින් වෙන් කොකළ) ... ... ... | 1,000.00 |
| එකතුව ... | 1,000.00 |

1965.8.17 වැනි දින පැවැත්වූ සාමාන්‍ය මාසික සභා රැස්වීමේදී අංක 10 දරණ යෝජනාවෙන් සභාසම්මත විය.

කේ. ඒ. ඩී. කරුණාරත්න,
සභාපති.

සුළු නගරසභා කායඃාලය,
මුල්ලේරියාව,
අංගොඩ, 1965 අගෝස්තු මස 24 වැනි දින,

අනුමතකරණ ලදී.

ඊ. වී. ඇස්. ද අල්විස්,
සහකාර පළාත් පාලන කොමසාරිස්,
(බටහිර කොටස),

කොළඹ 4,
1965.9.29 දින.

10–702—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

## අය-වැය ලේඛනය—මීරිගම සුළු නගර සභාව

**1965 අය වැය : නගර සභා මුදල් නියෝග 40 (ii) ප්‍රකාර අයදුම් පත්‍රයයි**

අන්‍ය වැය සම්මතයන්හි අනුරූප අතිරේක ප්‍රතිපාදයන් සඳහා වැය සම්මතයන්ගෙන් ඉතිරි වී තිබෙන මුදල් යෙදවීමට වර්ෂ 1965 ක්වූ සැප්තැම්බර් මස 16 වෙනි දින පවත්වන ලද මීරිගම සුළු නගර සභාවේ සාමාන්‍ය මාසික රැස්වීමේ දී අංක 5 (ii) යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත කර ගන්නා ලදී.

### I වැනි කොටස—සාමාන්‍ය

**ශේෂය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—1 (සී) බදු අයකරන්නන් සඳහා කොමිස් ... | 631 | 0 |
| සී.—3 (සී) ගබඩා ... ... ... | 100 | 0 |
| සී.—7 (සී) මුද්‍රණය යනාදිය ... ... | 55 | 0 |
| | 786 | 0 |

**අතිරික්තය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—1 (ජී) ජීවන හා විශේෂ ජීවනාධාර ... ... | 473 | 0 |
| ඒ.—2 (ඒ) ආධාර (එලවන්ස්) ... ... | 63 | 0 |
| ඒ.—2 (බී) ගමන් ගාස්තු ... ... | 50 | 0 |
| ඒ.—2 (ඇප්) ලිපිද්‍රව්‍ය, මුද්‍රණය, ප්‍රසිද්ධ කිරීම සහ මුද්දර ... | 200 | 0 |
| | 786 | 0 |

### II වැනි කොටස—විදුලි අංශය

| | රු. | ශ. |
|---|---|---|
| 4.—(ඒ) පරිපාලක වේතන හා ආධාර ... ... | 725 | 0 |
| 4.—(බී) සංචාරක සේවක වේතන හා ආධාර ... | 1,000 | 0 |
| | 1,725 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| 6. දීර්ග කිරීම සහ දියුණු කිරීම ... ... | 1,725 | 0 |
| | 1,725 | 0 |

ජේ. ඒ. අමරතුංග,
මීරිගම සුළු නගර සභාවේ සභාපති.

1965.9.16 දින, මීරිගම,
සුළු නගර සභා කාර්‍යාලයේ දී ය.

10-688—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## පුස්සැල්ලාව සුළු නගර සභාව

**සුළු නගර සභා මුදල් රෙගුලාසි අංක 40 (ii) දරණ කොටස යටතේ අයදුම්පත—වර්ෂ 1965 අය වැය ලේඛනය**

1965 අය වැය ලේඛනයේ ඒ ඒ ශීර්ෂ යටතේ වෙන් කරන ලද මුදල් වලින් ඉතිරි වේයයි ගණන් බලන ලද පහත දක්වෙන ශීර්ෂ යටතේ මුදල් ඊට අනුරූපව දක්වෙන වැය ශීර්ෂ වලට මාරු කර අවශ්‍ය වී තිබෙන අතිරේක වැය සඳහා එම ශීර්ෂ යටතේ යෙදීමට 1965 ක්වූ සැප්තැම්බර් මස 24 වැනි දින පවත්වන ලද මාසික සභා රැස්වීමේ අංක 22 (5) දරණ සම්මුතියෙන් සභා සම්මත විය.

### I වැනි කොටස—සාමාන්‍ය

**ඉතිරි මුදල් වැය ශීර්ෂය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—1 (ජී) ජීවන හා විශේෂ ජීවන ආධාර ... ... | 1,225 | 0 |
| | 1,225 | 0 |

**වැඩිපුර වියදම් වැය ශීර්ෂය**

| | රු. | ශ. |
|---|---|---|
| ඒ.—2 (ඊ) නීතියේ කටයුතු සඳහා ... ... | 150 | 0 |
| ඒ.—2 (ඇෆ්) ලිපි ද්‍රව්‍ය, මුද්‍රණය, ප්‍රසිද්ධ කිරීම් හා මුද්දර ... | 1,000 | 0 |
| සී.—7 (බී) නඩත්තු කිරීම ... ... ... | 75 | 0 |
| | 1,225 | 0 |

### II වැනි කොටස—විදුලි අංශය

| | රු. | ත. |
|---|---|---|
| 2. (බී) විදුලි බලය සැපයීමේ ප්‍රධාන කම්බි නඩත්තු කිරීම ... | 170 | 0 |
| | 170 | 0 |

| | රු. | ශ. |
|---|---|---|
| 4. (ඒ) පරිපාලක වේතන හා ආධාර ... ... | 20 | 0 |
| 4. (සී) මුද්‍රණය හා ලිපි ද්‍රව්‍ය ... ... | 150 | 0 |
| | 170 | 0 |

ඒ. සී. ඩබ්ලිව්. පෙරේරා,
සභාපති,
පුස්සැල්ලාව සුළු නගර සභාව.

1965 ක්වූ ඔක්තෝබර් මස 2 වැනි දින,
පුස්සැල්ලාව සුළු නගර සභා කාර්‍යාලයේ දිය.

10-683—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

# දේපල විකිණීම්

## මාතලේ නාගරික සභාව

### හිඟ වරිපනම් සඳහා දේපල විකිණීම

තහනම් කිරීම සඳහා චන්වල දේපල නැති හෙයින් 1964 දෙවෙනි කාර්තුව අවසානය දක්වා මෙයට යාකර ඇති උපලේඛනයෙහි දක්වෙන ස්ථානයන් වෙනුවෙන් ලැබිය යුතු හිඟ වරිපනම් සම්බන්ධයෙන් 1947 අංක 29 දරණ නාගරික සභා ආඥපනතේ 252 වෙනි ඡේදය අනුව ම විසින් නිකුත් කරණ ලද වරෙන්තුවක බලය පිට තහනම් කරණ ලද (1) අවුරුදු 1 සිට 10 දක්වා ඇති කුලිය සහ ලාභ (2) ලී දඬු සහ උපදින ද්‍රව්‍ය (3) ගෙයි උපකරණ සහ (4) පහත සඳහන් දේපලමත් ඒවා වෙනුවෙන් ලැබියයුතු වරිපනම් ගාස්තු සහ වියදම යථා කාලයේහි ගෙවනු නොලැබුවහොත් සඳහන් එකී දිනයන්හි පූ. භා. 9 යට පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට පටන්ගනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

ඩබ්ලිව්. ඒ. ඊ. පීරිස්,
නාගරික කොමසාරිස්, මාතලේ.

නාගරික සභා කාර්යාලය,
මාතලේ,
1965 සැප්තැම්බර් 29 වෙනි දින.

### උපලේඛනය

**1965.11.1**

අගලවත්ත—හරස්ගම පාර : 15/2ඒ, 15/1, 21/14, 21/16, 4, 6
අගලවත්ත පාර : 5, 9, 9/1, 15, 15ඒ, 15සී, 15ඩී, 15ඊ, 15ඇප්, 17, 65, 36, 50, 66/2, 70/2
බෝගහකොටුව පාර : 41
බෝමලුව පාර : 9, 15/2, 15/3
හරස්ගම පාර : 15/1, 45, 65, 88/4
1 වෙනි මාවත : 15ඒ/1
2 වෙනි මාවත : 7/4, 17
පන්සල පටුමඟ : 15/1, 30/3, 30/5

**1965.11.2**

පිට්ටනිය පාර : 55, 102
කච්චේරිය පාර : 24/7, 24/11
රජ වීදිය : 79/1, 85, 153, 32/1, 78, 210/3, 214, 220/1
මල්වත්ත පාර : 21/26, 49, 4/5, 18/1, 28
මහදෙවට පාර : 9/2, 9/5, 33/3
මීවත්තාකුඹුර පාර : 75/7
විහාර පාර : 51/1, 51/6, 51/6ඒ, 53/1, 53/2, 57, 103, 36/24, 44/8, 56, 58, 76

**1965.11.4**

දෙඩම්දෙනිය පාර : 41, 55, 24/1
දෙඩම්දෙනිය රවුම්පාර : 60
හුලංගමුව පාර : 36/1, 36/5, 112, 150/18, 206/7, සහ 8, 206/10, 258/6, 258/8, 258/9, 31/1, 37, 37ඒ, 39, 39/1, 39/4, 39/5, 39/6, 39/7, 39/8, 39/10, 39/12, 39/13, 83, 39/9, 39/2, 39/3

**1965.11.5**

දෝමල මාවත : 34
දෝමල පාර : 7/13, 7/14, 59.
ගොන්ගාවෙල පාර : 7/2, 55, 127, 30/1, 30/2
හැරිසන් ජෝන්ස් පාර : 63/1, 24, 26, 28
නුවර පාර : 57, 59, 75
මොයිසි ක්‍රිසන්ට් 1 වෙනි පටු මඟ : 3, 5, 19, 24, 26, 28/1
මොයිසි ක්‍රිසන්ට් 2 වෙනි පටුමඟ : 19/13, 19/14, 19/15, 21, 4, 18, 22

**1965.11.9**

බන්ඩාරපොල පාර : 5, 2, 10, 36, 36/1, 36/3, 86/1
හෙට්ටි වීදිය : 21, 56, 64, 66, 68, 106/8, 132/5
හුසේන් මාවත : 19, 19/1, 19/2, 19/4, 19/5, 22, 22ඒ, 28/2
මොලන්දපිටිය පාර : 28, 1
ත්‍රිකුණාමල වීදිය : 59, 59/1, 59/2, 59/3, 59/4, 59/5, 189

**1965.11.12**

ගොඩපොල පාර : 89/2, 135/2, 135/3, 135/4, 147/1, 147/2, 147/3, 90/1, 106, 122, 126, 154, 156
මුහන්දිරම් පාර : 53, 55, 57
කාරලන්ද පාර : 1, 21/7, 27, 27/4, 27/5, 14/1, 14/2

**1965.11.13**

රත්තොට පාර : 35/3, 35/4, 35/8, 35/11, 37, 37/1, 37/2, 37/3, 37/4, 37/5, 37/6, 37ඒ, 37බී, 39, 39ඒ, 39බී, 10/6, 12, 30, 40, 40ඒ, 50
ත්‍රිකුණාමල වීදිය : 569, 721/128, 727, 743, 745, 747, 791, 791/1, 566 620, 688, 712, 770, 800, 728.

10–722—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## ගලේවල සුළු නගර සභාව

### හිඟ වරිපනම් සඳහා දේපල විකිණීම

ගලේවෙල සුළු නගර සභා සීමාව තුළ පිහිටි මාතලේ පාරේ වරිපනම් අංක 25 දරණ ස්ථානයෙන් 1964 වර්ෂයේ 1 සිට 4 දක්වා කාර්තුවලට ලැබිය යුතු හිඟ වරිපනම් සම්බන්ධයෙන් 256 වෙනි අධිකාරය වන සුළු නගර සභා ආඥපනතේ 169 (1) දරන වගන්තියෙන් කියවෙන පරිදි 252 වෙනි අධිකාරය වන මහ නගර සභා ආඥපනතේ 252 වෙනි වගන්තිය අනුව ගලේවෙල සුළු නගර සභාවේ සභාපති තුමා විසින් නිකුත් කරණ ලද වරෙන්තුවක බලය පිට තහනම් කර අල්ලා ගන්නා ලද පහත සඳහන් උපලේඛනයෙහි දක්වෙන බඩුබාහිරාදිය, එකී දේපල වෙනුවෙන් ලැබිය යුතු වරිපනම් මුදල් සහ වියදම් යථා කාලයෙහි ගෙවනු නොලැබුවහොත් ඒවා 1965.11.12 වෙනි දින පූ. භා. 10ට ගලේවෙල සුළු නගර සභා කාර්යාල භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

ගා. හෙ. ආ. හෙන්ද්‍රික් අප්පුහාමි,
සභාපති,
ගලේවෙල සුළු නගර සභාව.

සුළු නගර සභා කාර්යාලය,
ගලේවෙල, 1965.10.5

### උපලේඛනය

| විස්තර | ප්‍රමාණය | ගණන |
|---|---|---|
| පරණ ටකරන් තහඩු ... | ... 8′ × 2′ − 3″ ... | 7 |
| පරණ ටකරන් තහඩු ... | ... 6′ × 2′ − 3″ ... | 4 |

10–522—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

# විවිධ දැන්වීම්

## නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව

### 1966 වර්ෂයට දේපොළ බද්ද

පළාත් ආණ්ඩු සභා ආඥපනතේ 255 වන අධිකාරය යටතේ මෙම ගතවී යන අවුරුද්දට බලපවත්නා පහත සඳහන් දේපොල බදු 1966 වර්ෂයටද එලෙසම පැනවීමට නාවලපිටිය පළාත් ආණ්ඩු සභාව තීරණය කර ඇති බව තත් පළාත් ආණ්ඩු සභාව මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

160(3) වගන්තිය ප්‍රකාර මෙම පළාත් ආණ්ඩු සභාව තුළ පිහිටා තිබෙන සියලුම නිශ්චල දේපලවල වාර්ෂික වටිනාකමින් සියයට අට බැගින් වාර්ෂික බදු පිළිවෙළින් මාර්තු 31 වැනිදාසින්, ජූනි 30 වැනි දාසින්, සැප්තැම්බර් 30 වැනි දාසින් හා දෙසැම්බර් 31 වැනි දාසින් අවසන් වන අයුරු ත්‍රෛමාසික වශයෙන් ගෙවිය හැකි වේ.

ජී. ඒ. ඩේවිඩ් පෙරේරා,
නාවලපිටිය පළාත් ආණ්ඩු සභාවේ සභාපති.

1965 ඔක්තෝබර් මස 2 වැනි දින,
නාවලපිටිය පළාත් ආණ්ඩු සභා කාර්යාලයේ දීය.

10–721/3—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

## මීරිගම සුළු නගර සභාව

### සුළු නගර සභා ආඥාපනත

### 1966 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වැනි අධිකාරය) යටතේ, ගතවී යන මෙම වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1966 වර්ෂයටද එලෙසම පැණවීමටද මීරිගම සුළු නගර සභාව තීරණය කර ඇති බැව් මෙයින් ප්‍රකාශයට පත් කරණු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුළ පිහිටා තිබෙන (කුඹුරු හැර) සියළුම නිශ්චල දේපල වල වටිනාකමින් සියයට පහ බැගින් වාර්ෂික බදු පිළිවෙලින් මාර්තු 31 වැනිදායින්, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වැනිදායින්, සහ දෙසැම්බර් 31 වැනිදායින් අවසන්වන අයුරු කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ජේ. ඊ. අමරතුංග,
මීරිගම සුළු නගර සභාවේ සභාපති තැන.

1965, සැප්තැම්බර් මස 29 වැනි දින,
මීරිගම සුළු නගර සභා කායාීලයේ දීය.

10–732—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## කොච්චිකඩේ සුළු නගර සභාව

### 1966 වර්ෂයට දේපල බද්ද

සුළු නගර සභා ආඥාපනත (256 වන අධිකාරය) යටතේ ගතවී යන 1965 වැනි වර්ෂයට බලපවත්නා පහත සඳහන් දේපල බදු 1966 වැනි වර්ෂයටද එලෙසම පැනවීමට කොච්චිකඩේ සුළු නගර සභාව තීරණය කර ඇති බව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලැබේ.

159 වැනි වගන්තිය ප්‍රකාර මෙම සුළු නගර සභා සීමාව තුල පිහිටා තිබෙන සියළුම නිශ්චල දේපල වලට වාර්ෂික වටිනා කමින් සියයට හය බැගින් වාර්ෂික බදු පිළිවලින් මාර්තු 31 වැනිදායින්, ජූනි 30 වැනිදායින්, සැප්තැම්බර් 30 වැනිදායින් හා දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන අයුරින් කාර්තු වශයෙන් ගෙවිය හැකිවේ.

ඩබ්ලිව්. ඊ. ඊ. ඒ. ජේ. ද සිල්වා,
සභාපති,
කොච්චිකඩේ සුළු නගර සභාව.

සුළු නගර සභා කායාීලය,
කොච්චිකඩේ, 1965 ක්වූ ඔක්තෝබර් මස 2 දීය.

10–701—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## මතුගම සුළු නගර සභාව

### 1966 වර්ෂය සඳහා රථවාහන හා සතුන් පිළිබඳ බද්ද

### 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනත

මතුගම සුළු නගර සභාව මෙයින් ප්‍රකාශයට පත්කරනු ලබන්නේ—

(1) 256 වන අධිකාරය වන සුළු නගර සභා ආඥාපනතේ අංක 161 දරණ වගන්තිය යටතේ පහත උපලේඛනයේ විස්තර වන ගණන් අනුව 1966 අවුරුද්දට රථවාහන හා සතුන් සඳහා බද්දක් පනවා අයකිරීමටද ;

(2) එකී ආඥාපනතේ 162(3) වගන්තිය යටතේ එකී බදු 1966 මාර්තු 31 දා හෝ ඊට පෙර ගෙවිය හැකි අයුරින් ද වේ.

#### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, රෝදත්‍රයේ මෝටර් කාර්, මෝටර් ලොරි, මෝටර් පාපැදි, කරත්ත, අත් කරත්ත, රික්ෂෝ රථ, පාපැදි හෝ රෝදත්‍රයේ පාපැදි හැර වෙන ඕනෑම අන් දමේ වාහනයක් සඳහා ... ... ... | 5.00 |
| සෑම පාපැදියක්, රෝදත්‍රයේ පාපැදියක් හෝ පාපැදි මෝටර් රථයක් හෝ කරත්තයක් නැතහොත් මෝටර් රථයක් හෝ කරත්තයක්— | |
| (අ) වෙළඳ කායාීයන් සඳහා පාවිච්චි කෙරේ නම් ... ... ... | 2.50 |
| (ආ) වෙළඳ කායාීයන් හැර වෙන කටයුතු සඳහා පාවිච්චි කෙරේ නම් ... ... | 1.00 |
| ගොන් දෙන්නා බඳින බර කරත්තයකට හෝ තිරික්කලය කට ... ... ... | 4.00 |
| තනි ගොනා බඳින කරත්තයකට හෝ තිරික්කලය කට ... ... ... | 2.50 |
| අත් කරත්තයකට ... ... ... | 1.00 |
| ජින් රික්ෂෝ රථයකට ... ... | 2.50 |
| අශ්වයෙකුට, අශ්ව පෝනියෙකුට හෝ කොටළුවෙකුට ... | 5.00 |
| අලියෙකුට, ඇතෙකුට හෝ ඇතින්නියකට ... ... | 25.00 |

දයා වී. පස්කුවල්,
සභාපති,
මතුගම සුළු නගර සභාව.

සුළු නගර සභා කායාීලය,
මතුගම, 1965.10.7.

10–686/1—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## මතුගම සුළු නගර සභාව

### 1966 වර්ෂයේ සුනඛයන් ලියාපදිංචි කිරීමේ ගාස්තු

### සුනඛයන් ලියාපදිංචි කිරීමේ ආඥාපනත (334 වැනි පරිච්ඡේදය)

සුනඛයන් ලියාපදිංචිකිරීමේ ආඥාපනත (334 වැනි පරිච්ඡේදය) 4 වැනි වගන්තිය යටතේ, මතුගම නගර සභා බල ප්‍රදේශය තුල ඇතිකර සිටින සෑම පිරිමි සුනඛයෙකු සඳහා ශත පණහ (50) බැගින් ද, ගෑණු සුනඛයෙකු සඳහා රුපියල් එකක් (1) බැගින් ද, 1966 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවන අයුරින් ලියාපදිංචි කිරීමේ ගාස්තුවක් පණවා අය කිරීමට මෙම සුළු නගර සභාව තීරණය කළ බව ප්‍රකාශයට පත්කරනු ලැබේ.

දයා. වී. පස්කුවල්,
සභාපති,
මතුගම සුළු නගර සභාව.

සුළු නගර සභා කායාීලය,
මතුගම, 1965.10.7.

10–686/2—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## නාරම්මල ගම්සභාව

### මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත සඳහන් උපලේඛනයේ නම් සඳහන් අය එහි සඳහන් ස්ථානවල 1965 ඔක්තෝබර් මස 1 වෙනි දින සිට 1965 දෙසැම්බර් මස 31 වෙනි දින තෙක් මස්කඩ පවත්වාගෙන යාමට බලපත්‍ර ඉල්ලුම්කර තිබෙන බවත්, මෙම බලපත්‍ර නිකුත්කිරීම ගැන නාරම්මල ගම්සභා ප්‍රදේශය තුළ පදිංචි යම් කෙනෙක් විරුද්ධ වන්නෙහිනම් ඒ කුමන කරුණක් නිසාද යන වග ඇතුළත් ලියවිල්ලක් පිටපත් දෙකකින් යුක්තව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14ක් ඇතුළත ලියා එවීමට බලය තිබෙන බවත් මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනතේ 201 වැනි පරිච්ඡේදයේ 1947තේ අංක 44 දරණ සංශෝධිත ආඥාපනතේ 6 වෙනි වගන්තියේ සංශෝධනය කරන ලද 7 වෙනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි,

#### උපලේඛනය

| ඉල්ලුම්කරුගේ නම | | ස්ථානය සහ වෙළඳාම |
|---|---|---|
| ඇම්. ඇස්. ඇස්. ඒ. අජීස් | ... | නාරම්මල ප්‍රසිද්ධ වෙළඳපලේ අංක 1 දරණ එළහරක් මස් කඩය. |
| පී. කේ. ඒ. හාජා මොහිදීන් | ... | නාරම්මල ප්‍රසිද්ධ වෙළඳපලේ අංක 3 දරණ එළහරක් මස් කඩය. |

ජී. ඩී. දයානන්ද,
නාරම්මල ගම්සභාවේ සභාපති.

1965 ඔක්තෝබර් මස 5 වෙනි දින,
නාරම්මල ගම්සභා කාර්යාලයේ දීය.

10–693—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

## මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත

මෙහි පහත දක්වෙන උපලේඛනයෙහි සඳහන් අය විසින් මස් විකිණීම පිණිස 1966.1.1 දින සිට 1966.12.31 දක්වාවූ වර්ෂයට බලපත්‍රයක් ඉල්ලා තිබෙන බවත්, මෙම බලපත්‍රය නිකුත් කිරීමට විරුද්ධවන කුරුණෑගල දිස්ත්‍රික්කයේ ගල්ගමුව ගම්සභා ප්‍රදේශය ඇතුළත පදිංචි ඕනෑම කෙනෙකුට තමා ඒ සඳහා විරුද්ධ වන්නේ අසවල් කරුණ නිසායයි දක්වෙන ලියවිල්ලක් පිටපත් දෙකකින් යුතුව මෙම දැන්වීම ගැසට් පත්‍රයේ පළවන දින සිට දින 14 ක් ඇතුළත මා වෙත ලියා එවීමට බලය තිබෙන බවත්, මස් පිණිස සතුන් මරන්නන් පිළිබඳ ආඥාපනත යටතේ (201 වැනි පරිච්ඡේදය) අංක 44 දරණ ආඥාපනතින් සංශෝධිතවූ අංක 6 දරණ ආඥාපනත යටතේ මෙයින් දැනුම් දෙමි.

### උපලේඛනය

| ඉල්ලුම් කරු | | ස්ථානය | වෙළෙඳාම |
|---|---|---|---|
| (1) ඇස්. ඇම්. තාහීර් | ... | ගල්ගමුව ගම්සභාවේ පොදු වෙළෙඳ පල | එළුහරක් මස් |
| (2) ඇස්. ඇම්. තාහීර් | ... | ගල්ගමුව ගම්සභාවේ පොදු වෙළෙඳ පල | එළු මස් |

විමල් මඩදෙණී,
ගල්ගමුව ගම්සභාවේ වැඩබලන සභාපති.

1965.10.4 දින,
ගල්ගමුව ගම්සභා කාර්‍යාලයේදීය.

10–728—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## මාතර නගරය

### රථවාහන හා සතුන් පිළිබඳ බද්ද—1966

1939 අංක 61 දරණ පළාත් ආණ්ඩු සභා ආඥාපනතේ 162 (1) (ඊ) වැනි වගන්තිය යටතේ පහත සඳහන් උපලේඛනයේ නම් කරන ලද රථ වාහන ඉදිරියෙන් සඳහන් කර තිබෙන ගාස්තු (පසුගිය වර්ෂයට මෙන්ම) 1966 වර්ෂයට ද මාතර නගරයේ බල මංඩල සීමාව තුළ පනවා ඇති බවත් එකී ගාස්තු 1966 මාර්තු 31 වැනි දින හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

### උපලේඛනය

| | රු. ශ. |
|---|---|
| මෝටර් කාර්, ට්‍රයිසිකල්, මෝටර් ලොරි, මෝටර් බයිසිකල්, කරත්ත, අත් කරත්ත, ජින් රික්ෂෝ, බයිසිකල් සහ රෝද තුනේ බයිසිකල් හැර වෙන ඕනෑම් රථයකට ... ... | 2 50 |
| ඕනෑම බයිසිකලයකට හෝ රෝද තුනේ බයිසිකලයකට— | |
| (අ) වෙළෙඳ කාර්‍යයන් සඳහා පාවිච්චි කරන්නේ නම් ... ... | 5 00 |
| (ආ) වෙළඳ කාර්‍යයන් හැර වෙන ඕනෑම කාර්‍යයක් සඳහා පාවිච්චි කරනු ලබන්නේ නම් ... | 1 00 |
| ඕනෑම අන්දමක ගොන් දෙන්නා බඳින බර කරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් ... | 3 00 |
| ඕනෑම අන්දමක තනිගොනා බඳින කරත්තයක් හෝ තිරික්කලයක් වෙනුවෙන් ... | 2 50 |
| ඕනෑම අන්දමක අත් කරත්තයක් වෙනුවෙන් ... | 1 00 |

එච්. ඒ. පී. අභයවර්ධන,
මාතර නගරයේ විශෙෂ කොමසාරිස්.

1965 ඔක්තෝබර් මස 1 දා,
මාතර විශෙෂ කොමසාරිස් කාර්‍යාලයේදීය.

10–713/1—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

## මාතර නගරය

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ගාස්තු—1966

### සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 477 වැනි පරිච්ඡේදය

සුනඛයින් ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (477 වැනි පරිච්ඡේදයේ) 4 වැනි කොටසේ ප්‍රකාර මාතර නගරයේ බල මණ්ඩල සීමාව තුළ තබාගන්නා සෑම බල්ලෙකුට රු. 2.50 ක් හා සෑම බැල්ලකට රු. 5 ක් හා බැගින් 1966 වර්ෂයට ලියාපදිංචි කිරීමේ ගාස්තු පනවා ඇති බවත්, එකී ගාස්තු 1966 මාර්තු 31 වැනි දා හෝ ඊට පෙර ගෙවිය යුතු බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

එච්. ඒ. පී. අභයවර්ධන,
මාතර නගරයේ, විශෙෂ කොමසාරිස්.

1965 ඔක්තෝබර් මස 1 වැනි දා,
මාතර විශෙෂ කොමසාරිස් කාර්‍යාලයේදීය.

10–713/2—65.10.15 දින අංක 14,533 දරන ගැසට් පත්‍රය

---

සෑම සිකුරාදා දිනයකම ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියකදීම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.

ගැසට් පත්‍රය පළ කරන දින සිට කාර්යාලය වැඩ කරන දින සතරකට ප්‍රථම පස්වරු 3.30 ට සියළුම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපති තැනට ලැබෙන සේ එවිය යුතුයි (සාමාන්‍ය වශයෙන් සඳුදා පස්වරු 3.30 ට ප්‍රථමයෙන්).

ගැසට් පත්‍රය ලබාගැනීම සඳහා දායක මුදල් කොළඹ, මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත කෙළින්ම ගෙවිය යුතුය. ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දායක මුදල් භාරගනු නොලැබේ.

ලංකාවේ වාලච්චේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල
ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි